# රදාවානේ කෙළිවිසිතුර තුංමංහංදියෙන්...

තාරිකා චතුර භාෂිණී මනතුංග

'මට විජේරත්න මහතාගේ කීමක් මතක් වෙයි. ලෝකේ ගුරුවරු ඉන්නවා. ඕන තරම් ලිපිකරුවො ඉන්නවා. එදත් හිටියා. මත්තටත් ඉඳීවි. නමුත් මයිකල් ඇන්ජිලෝලා ලෙනාඩෝ ඩාවින්චිලා ලෝකෙටම හිටියේ එක්කෙනයි. එහෙම අය පහළ වෙන්නේ කලාතුරකින්...'එකී කියමන යථාර්ථවත් කරලමින් ක්ෂේත්‍ර ගණනාවකින් දස්කම් පෑ අග්‍රගණ්‍ය කලාකෙතක් බඳු මිනිසෙකු ලෙස මහගම සේකරයන් හඳුන්වාදීමට හැකිය. 1929 අප්‍රේල් මස 7 වන දින ගම්පහ  දිස්ත්‍රික්කයේ රදාවාන ග්‍රාමයේ ජන්ම ලාභය ලත් මෙම අද්විතීය මිනිසා දහසකුත් මෙහෙවරයනට උර දී 1976 ජනවාරි මස 14 වන දින දැයට සමුදුණි. කෙටි ජීවන කාලයක් තුලදී යුග පුරුෂයෙකු ලෙස තමාගෙන් ලොවට ඉටුවිය යුතු මෙහෙවර ණය නැතිව ඉටුකළවුන් අතර සේකරයන් පෙරමුණේ සිටී. ඔහු විසින් චරිතාපදානයක් ලෙස රචිත තුංමංහංදිය නවකතාව 1967දී ප්‍රථම වරට පිටු 106කින් යුක්තව රචිතය. හුදෙක් චරිතාපදානයක් ලෙස පමණක් ලඝු කළ නොහී මෙම නවකතාව වූකලී එදා සමාජයේ පැවති කෙළි මැනවින් නිරූපණය කරයි. ඒ පිළිබඳව පවත්නා සාධක මතු දැක්වෙන පරිදි ගෙනහැර දක්වනු කැමැත්තෙමි.

"මුදුන්පිට කන්දට පැමිණි පසු අප හැමදාම වාගේ කරන චාරිත්‍රයක් ඇත. එනම් කන්ද මුදුනේදී පාර මැද එකම තැනකට මුත්‍රා කිරීමය. මුත්‍රා ධාරාව අගින් මහත්ව තාරපාර දිගේ සෙමෙන් සෙමෙන් පල්ලම් බහී.අප සරඹ කරන්නට මෙන් දෙපෙළ සෑදී ඒ අනුව දෙපසින් ගමන් කරමු. මුත්‍රා පාර ඈදට ගියොත් කෝටු කෑල්ලකින් එය නිසි මඟට යොමු කිරීමට පුලුවන..." එදා සමාජයේ පාසල් ගොස් නිවස බලා එන මොහොතේදී කුඩා දරුවන් විඳි විශ්‍රාන්තියේ අපූර්වත්වයයි ඒ."කොල්ලෝ ගල් අමුණට නැගී කරණම් ගසමින් දියට පනිති. දිය යටින් පීනා ගොස් ඈතින් මතුවෙති.ඔට්ටු දෙති.වතුර ගසා ගනිති..."සැබවින්ම සේකරයන් රචනා කොට ඇත්තේ අසිරියක්මය.නොදැනුවත්ම සේකරයන් අතින් එදා සමාජයේ සතුට විනිවිද ගිය අයුරු නවකතාව තුළ සිත්තමක් වූවක් මෙනි.මෙපමණකුදු නොව මතු දැක්වෙන නිදර්ශනයෝද එකරුණම සනාථ කරලන්නේ වෙයි."මම දාං අඳින දිහා බලා සිටිමි. දෙන්නා නිශ්ශබ්දව දාං ලෑල්ල දිහා බලාගෙන භාවනා කරති.බොහෝ වේලාවකට පසු වර්ලියානු ඉත්තෙක් අඳී.ඊට පසු දෙදෙනාම යළිත් භාවනා කරති.තවත් බොහෝ වේලාවකට පසු මිස්ටෙද ඉත්තෙක් අඳී.මේක මොන කෙහෙල්මල් සෙල්ලමක්දැයි මෙය බලා සිටින මට සිතේ..." "...මම සරුංගලය රැගෙන උක්කුනුත් සමඟ වෙලට යමි.උක්කුන්ට තරම් හොඳට සරුංගල් අරින්ට මට බැරිය..." "...සවස දෙක තුන වන විට කොලු කණ්ඩායම බදු වත්තට එකතු වෙති.අපි චක්ගුඩු පනිමු.යුද්ද කරමු. දුවමු. ඇල්බට ටයර් එක තුළට රිංගා ගුලි ගැසී සිටින විට උක්කුං එය තල්ලු කරගෙන දුවයි.ටයර් එක ඒ තුළ සිටින ඇල්බටුත් සමඟම කැරකීයයි..."තුංමංහංදිය නවකතාව වූකලී හුදෙක් චරිතාපදානයක් ලෙස පමණක් ලඝු කළ නොහැක්කේ මෙලෙසට අපූර්ව විශ්‍රාන්ති ගති ලක්ෂණද විනිසවමින් දිග හැරෙන නිසාය.මෙනිසා තුංමංහංදිය නවකතාව 60,70 දශකයන්හිදී ලාංකේය ගැමි ජීවන රටාව හා බැඳි ක්‍රීඩා හා විශ්‍රාන්තිමය අසිරිය මැනවින්ම නිරූපණය කරලන්නේ වෙයි. "මැලේරියා සතියේ විරිඳු කීමට ඉස්කෝලයෙන් තේරුණේද මාත් ආරොනුත්ය..." "මෙහිදී ආරොන් රබාන ගැසූ අතර මම විරිඳු කීමි..." "විරිඳු පංතියක් විකට ජවනිකාවක් සිංදුවක් ආදී වශයෙන් අංග කීපයක්ම විවිධ ප්‍රසංගයට ඇතුළත් වූ නමුත් ප්‍රශංසාව ලැබුණේ සරස්වතී පූජාවටය..."තුංමංහංදිය නවකතාව වූකලී මෙම සුවිශේෂතාද හිසින් ගෙන දිව යන්නකි. එදා සමාජයේ ගැමි ජීවන සුවඳ එදා සමාජයේ විශ්‍රාන්තිමය අසිරිය මෙම නවකතාව තුළ මැනවින් දිග හැරෙනුයේ එලෙසටය.මෙනිසා තුංමංහංදිය නවකතාව සර්ව කාලීනව රසවිඳිය හැකි ඉතා පළල් රසවින්දනයකින් සහෘද හදවතට අමතන රසවත් නවකතාවක් ලෙස අගය කළ හැකිය. එදා සමාජයේ සතුට,සිනහවඇතුළත්ව එදා සමාජයේ පැවති කෙළි මැනවින් නිරූපණය කරන සුන්දර නවකතාවක් ලෙස තුංමංහංදිය නවකතාවසර්ව කාලීන ලෙස කියවන්නාගේ හදවත තුළ සදාකල් නවතින්නේය.

මහගම සේකර,1967 තුංමංහංදිය,චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය